# දේශපාලන විද්‍යාව

## විෂය නිර්දේශය

## 12 - 13 ශ්‍රේණි

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

# පටුන


| | |
|---|---|
| පෙරවදන | iii |
| හැඳින්වීම | iv |
| ජාතික පොදු අරමුණු | v |
| මූලික නිපුණතා | vi - vii |
| විෂය අරමුණු | viii |
| ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව | ix - x |
| පාසල් වාර සැලැස්ම | xi |
| විෂය නිර්දේශය | 1 - 15 |
| පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් | 16 |
| ඇගයීම හා තක්සේරුකරණය | 17 |
| විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය | 18 |

# පෙරවදන

ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවේ අ.පො.ස. උසස් පෙළ විෂය ධාරාව සඳහා මෙම විෂය නිර්දේශය සම්පාදනය කර ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක වන්නේ 2017 වර්ෂයේදී ය. අ.පො.ස. උසස් පෙළ දේශපාලන විද්‍යාව විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත වී සිටින ගුරුභවතුන්ගේ සහ විෂය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අදහස් සහ ආකල්ප විශ්ලේෂණාත්මක ව අධ්‍යයනය කරමින්, ඔවුන්ගේ යෝජනා සැලකිල්ලට ගනිමින් මෙම විෂය නිර්දේශය සැළසුම්කර ඇත.

විෂය අන්තර්ගතය ප්‍රධාන නිපුණතා 15ක් යටතේ නිපුණතා මට්ටම් ගොඩනගා ගනිමින් සකස්කිරීමට පියවර ගෙන තිබේ. මෙම විෂය නිර්දේශය තුළින් අරමුණු කරන ලද ඉගෙනුම් පල ලබාගැනීම සඳහා මගපෙන්වීම් රැගත් ගුරුමාර්ගෝපදේශ දෙකක් 12 සහ 13 ශ්‍රේණි සඳහා ඉදිරියේදී හඳුන්වාදීමට නියමිතය. දේශපාලන විද්‍යා න්‍යාය සහ ප්‍රායෝගික පැතිකඩ විචාරශීලීව හැදෑරීමට මේ තුළින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වැඩි ඉඩකඩක් ලැබෙනු ඇත.

අ.පො.ස. උසස් පෙළ විභාගයට මුහුණ දී සාර්ථක ප්‍රතිඵල නෙලාගන්නටත් පරිපූර්ණ දේශපාලන දැනුමකින් යුත් යහපත් පුරවැසියන් බවට පත්වන්නටත් මෙම විෂය නිර්දේශය අධ්‍යයනය තුළින් දායකත්වය සැපයෙනු ඇතැයි විශ්වාස කරමු.

# හැඳින්වීම

2017 වර්ෂයේ ක්‍රියාත්මක වන අ.පො.ස. උසස් පෙළ දේශපාලන විද්‍යාව විෂය නිර්දේශය සඳහා මාතෘකා 15ක් ඇතුළත් කර ඇත. මෙම විෂය නිර්දේශය දේශපාලන විද්‍යාව හදාරන සිසු දරුවන් හට විෂය කරුණු මැනවින් ග්‍රහණය කරගත හැකි වන ලෙස සහ ගුරුභවතුන්ට නවතම විෂය කරුණු ඉගැන්වීමට පහසු වන පරිදි සකස් කිරීමට විශේෂ අවධානය යොමු කෙරිණි.

මෙහි පළමුවන හා දෙවන මාතෘකා දේශපාලන විද්‍යාව අවබෝධකර ගැනීම, දේශපාලනය සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙස අර්ථකතනය කිරීම හා දේශපාලන විද්‍යාව සමන්විත වන ක්ෂේත්‍ර ඔස්සේ දේශපාලන ලෝකය සම්බන්ධ ව වඩාත් විචාරාත්මක ව සිතීමට යොමුවන පරිදි විෂය අන්තර්ගතය සකස් වී ඇත. රාජ්‍යය සහ එහි භූමිකාව හඳුන්වා දෙමින්, මිනිස් නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයකට වඩාත් යෝග්‍ය වන ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කළ හැකි පරිදි ශිෂ්‍ය නිපුණතා වර්ධනය වන සේ නිපුණතා මට්ටම් මෙහි  ගොඩනගා ඇත. රාජ්‍යයේ බලය බෙදීම අනුව ආණ්ඩු ක්‍රම ආකෘති සකස්කර ඇති ආකාරය අධ්‍යයනයට ඉඩ සලසා ඇත. දේශපාලන මතවාද යටතේ දේශපාලනයට මෙකී මතවාද බලපාන ආකාරය දේශපාලන සංසිද්ධි ඇසුරින් විග්‍රහ කිරීමේ කුසලතා අත්පත් කර ගැනීමේ අරමුණින් ඉදිරිපත් කර ඇත.

වර්තමානයේ දී ගැටුම හා ගැටුම් සමථනය පුළුල් බහු විෂයයික අධ්‍යයන ධාරාවක් බවට පත් වී ඇති අත්‍යවශ්‍ය තේමාවකි. මෙය පෙර විෂය නිර්දේශය යටතේ 13 ශ්‍රේණියේ දී හැදෑරීමට නියමිත ව තිබුණ ද මෙවර 12 ශ්‍රේණියට ඇතුළත් කර ඇත.

ශ්‍රී ලාංකික ආණ්ඩුක්‍රම ඉතිහාසය තුළ ආර්ථික හා සමාජ අංශ කෙරෙහි යටත් විජිත පරිවර්තනයේ  ප්‍රවණතා හා ප්‍රතිඵල මෙන්ම 1947 සිට 1972 ව්‍යවස්ථාව යටතේ සිදු වූ ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය සහ ප්‍රවණතා පිළිබඳ විෂය කරුණු අධ්‍යයනයට ඇතුළත් කර ඇත. 13 ශ්‍රේණියේ විෂය මාතෘකා ආරම්භ කරමින් කාලෝචිත මාතෘකාවක් ලෙස දේශපාලන විද්‍යාවේ දී මැනවින් අවබෝධ කරගත යුතු ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ න්‍යායික පදනම සහ ප්‍රායෝගික පැතිකඩ විශ්ලේෂණාත්මක ව දැකීමට, ඉගෙනුම් පල යටතේ පවතින ආණ්ඩුක්‍රමවල භාවිත වන ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී නොවන ලක්ෂණ හඳුනා ගැනීම සඳහා විමර්ශනශීලී වීමට ද අවස්ථාව සපයා ඇත.

සමකාලීන ආණ්ඩුක්‍රම මාදිලි තුලනාත්මක ව අධ්‍යයනයට සිසු සිසුවියන් යොමු කර ඇත. සන්ධීය මාදිලි ලෙස ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව සහ ස්විස්ටර්ලන්තයත්, ඒකීය රාජ්‍ය යටතේ බ්‍රිතාන්‍ය සහ ශ්‍රී ලංකාවත්,  ඒකීය හා මධ්‍යගත රාජ්‍ය ව්‍යුහය යටතේ ප්‍රංශයේ ආණ්ඩු ක්‍රමයත්  මීට ඇතුළත් වේ. නැවත ශ්‍රී ලාංකීය දේශපාලන ව්‍යවහාර පිළිබඳ අවධානය යොමු කරමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පුළුල් ලෙස හැදෑරීමට සහ 13, 17, 18 සහ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කාලීන විෂය කරුණු ලෙස හැදෑරීමට ඉඩ ප්‍රස්තා සපයා ඇත. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය, ජාත්‍යන්තර දේශපාලනයේ ස්වරූපය සහ නව ප්‍රවණතා ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය විචාරශීලී ව හැදෑරීමට ද අවස්ථා ව ඇත.

නව දැක්මකින් යුක්ත ව දේශපාලන විද්‍යාව විෂය හැදෑරීමටත්, ඉගෙනුම් අරමුණු සාර්ථක ව ඉටුකරගත හැකි පරිදි දේශපාලනයේ ප්‍රායෝගික පැතිකඩ හඳුනා ගනිමින් පුරවැසි දායකත්වය පිළිබඳ ආකල්ප හා කුසලතා වර්ධනයට මෙන්ම සමාජීය වගකීම යටතේ මනෝ සමාජීය නිපුණතා වර්ධනයට මේ මගින් ශිෂ්‍යයන්ට මඟ පෙන්වනු ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින් සහ කණ්ඩායම් ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටිමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# දේශපාලන විද්‍යා විෂය ඉගැන්වීමේ අරමුණු

මෙම විෂය නිර්දේශය හැදෑරීමෙන් පසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් පහත සඳහන් කුසලතා හා හැකියාවන් අත්පත් කරගනු ඇත. ඒවා නම්,

- ශාස්ත්‍රීය විෂයයක් ලෙස දේශපාලන විද්‍යාවේ අන්තර්ගතය, තේමා සහ වැදගත්කම හඳුනා ගැනීම
- තමන් ජීවත්වන පරිසරයේ, සමාජයේ සහ ලෝකයේ දේශපාලන ක්‍රියාවලීන්, දේශපාලන ආයතන සහ දේශපාලන වෙනස්වීම් හඳුනාගැනීම හා විචාරාත්මක ව තේරුම් ගැනීම
- පුරවැසියන් හැටියට රටේත්, ලෝකයේත් ජීවත් වීමේ දී වැදගත්වන සාධනීය දේශපාලන සාරධර්ම, අරමුණු සහ මූලධර්ම පිළිබඳ ව සවිඥානික වීම
- දේශපාලන විද්‍යා විෂයයේ ඓතිහාසික සහ සමකාලීන ප්‍රවණතා හඳුනා ගැනීම
- සාධනීය සමාජ, දේශපාලන පරිවර්තන සඳහා පුරවැසියන් ලෙස දායකත්වය ලබා දීමට අවශ්‍ය දැනුම අවබෝධය සහ හැකියාවන් ලබා ගැනීම

## ජාතික අරමුණු හා විෂය අරමුණු අතර සම්බන්ධතාව

| ජාතික අරමුණු | විෂය අරමුණු | නිපුනතා මට්ටම |
|---|---|---|
| I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයන් මත පිහිටා ශ්‍රී ලංකාවේ බහුවිධ සමාජයේ සංස්කෘත විවිධත්වය අවබෝධය කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය ජාතික ඍජු ගුණය ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකික අනන්‍යතාවය තහවුරු කිරීම. | 3. පුරවැසියන් හැටියට රටේත් ලෝකයේත් ජීවත් වීමේ දී වැදගත් වන සාධනීය දේශපාලන සාරධර්ම. අරමුණු සහ මූලධර්ම පිළිබඳව සවිඥානක වීම. | 1.1 දේශපාලනය සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙස ආර්ථ කථනය කරයි.<br>1.2 දේශපාලන විද්‍යාව දේශපාලනයේ විවිධ පැතිකඩ ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කරන ශික්ෂණ මාධ්‍යයක් ලෙස විග්‍රහ කරයි.<br>2.2 සමාජයේ දේශපාලන ජීවිතය තුළ ඒවාගේ කාර්යය භාර්යය විමර්ශනය කරයි. |
| II වෙනස්වන ලෝකය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම. | 4. දේශපාලන විද්‍යා විෂයේ ඓතිහාසික සහ සමකාලීන ප්‍රවණතා හඳුනා ගැනීම. | 7.1 යටත් විජිත වාදය සහ යටත් විජිත පාලන ක්‍රමය ලංකාවේ ආර්ථික සමාජ සහ දේශපාලන පරිවර්තනයට තුඩු දුන් ආකාරය විග්‍රහ කරයි.<br>7.2 ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ ප්‍රතිවිපාක අවබෝධ කර ගනිමින් අදහස් දක්වයි.<br>8.1 නිදහසින් පසු ව්‍යවස්ථා සම්පාදනයට පසුබිම් වූ සාධක විස්තර කරයි. එම ආණ්ඩු ක්‍රම වල ප්‍රවණතා හා ගැටලු පෙන්වා දෙයි. |
| III මානව අයිතිවාසිකම් ගරු කිරීම යුතුකම හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම. | 5. සාධනීය සමාජ දේශපාලන පරිවර්තන සඳහා පුරවැසියන් ලෙස දායකත්වය ලබා දීමට දැනුම, අවබෝධය සහ හැකියාවන් ලබා ගැනීම<br>3. පුරවැසියන් හැටියට රටේත් ලෝකයේත් ජීවත් වීමේ දී වැදගත් වන සාධනීය දේශපාලන සාරධර්ම අරමුණු සහ මූලධර්ම පිළිබඳව සවිඥානක වීම. | 6.2 ගැටුම් සහ ගැටුම් නිරාකරණය පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික අංශ පැහැදිලි කරයි.<br>6.3 සාමය ගොඩ නැගීමේ සහ ප්‍රතිසංවිධානගත වීමේ වැදගත්කම පිළිබඳව විචාරාත්මකව අදහස් දක්වයි.<br>9.1 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ න්‍යායික පදනම හඳුනාගනී.<br>9.2 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ප්‍රායෝගික පැතිකඩ විශ්ලේෂණාත්මකව දකියි. |

| ජාතික අරමුණු | විෂය අරමුණු | නිපුනතා මට්ටම |
|---|---|---|
| IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුවසම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම. | 5. සාධනීය සමාජ, දේශපාලන පරිවර්තන සඳහා පුරවැසියන් ලෙස දායකත්වය ලබා දීමට අවශ්‍ය දැනුම අවබෝධය සහ හැකියාවන් ලබා ගැනීම. | 11.3 රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ නිලබල ක්‍රමයේ භූමිකාව පැහැදිලි කරයි. |
| V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංගලක්ෂණය සංවර්ධනය කිරීම. | 5. සාධනීය සමාජ, දේශපාලන පරිවර්තන සඳහා පුරවැසියන් ලෙස දායකත්වය ලබා දීමට අවශ්‍ය දැනුම අවබෝධය සහ හැකියාවන් ලබා ගැනීම. | 13.1 ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.<br>13.4 දේශපාලන පක්ෂ ක්‍රමයේ ලක්ෂණ සහ ප්‍රවණතා විග්‍රහ කරයි. |
| VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කරන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම. | 3. පුරවැසියන් හැටියට රටේත් ලෝකයේත් ජීවත් වීමේ දී වැදගත් වන සාධනීය දේශපාලන සාරධර්ම අරමුණු සහ මූලධර්ම පිළිබඳව සවිඥානක වීම. | 9.1 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ න්‍යායික පදනම හඳුනා ගනියි.<br>9.2 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ප්‍රායෝගික පැතිකඩ විශේෂණාත්මකව දකියි.<br>12.2 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහාත්මක ස්වභාවය වෙනස් කළ සංශෝධනවල පසුබිම හඳුනා ගනියි.<br>12.3 1978 සංශෝධන වලින් ආණ්ඩුක්‍රමයට ඇති කළ වෙනස්කම් වල ස්වභාවය හඳුනා ගනියි. (13, 17,18, 19 වන සංශෝධන) |

| ජාතික අරමුණු | විෂය අරමුණු | නිපුනතා මට්ටම |
|---|---|---|
| VII සීග්‍රයෙන් වෙනස්වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීමට සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම. | 2. තමන් ජීවත් වන පරිසරයේ, සමාජයේ සහ ලෝකයේ දේශපාලන ක්‍රියාවලින්, දේශපාලන ආයතන සහ දේශපාලන වෙනස්වීම් විචාරාත්මකව තේරුම් ගැනීම. | 12.3 1978 සංශෝධන වලින් ආණ්ඩුක්‍රමයට ඇති කළ වෙනස්කම් වල ස්වභාවය හඳුනා ගනියි.<br>14.1 ජාතික හා ජාත්‍යන්තර දේශපාලනයේ වෙනස්කම් හඳුනා ගනියි.<br>15.3 ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවනතා විශ්ලේෂණය කරයි.<br>15.4 වර්තමාන විදේශ ප්‍රතිපත්ති අභියෝග සහ ගැටළු අවබෝධ කර ගනිමින් අදහස් ප්‍රකාශ කරයි. |
| VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායකවන යුක්තිය, සමානාත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. | 3. පුරවැසියන් හැටියට රටේත් ලෝකයේත් ජීවත් වීමේ දී වැදගත් වන සාධනීය දේශපාලන සාරධර්ම, අරමුණු සහ මූලධර්ම පිළිබඳව සවිඥානක වීම. | 14.1 ජාතික හා ජාත්‍යන්තර දේශපාලනයේ වෙනස්කම් හඳුනා ගනියි.<br>14.2 ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාධරයන් හඳුනාගනිමින් අදහස් දක්වයි.<br>14.4 ජාත්‍යන්තර දේශපාලනයේ වර්තමාන ප්‍රවණතා හඳුනාගෙන ඒවා පැහැදිලි කරයි.<br>14.5 ජාතික හා ජාත්‍යන්තර දේශපාලනයේ නව ප්‍රවණතා ලංකාවට අදාලව හඳුනාගෙන විග්‍රහ කරයි. |

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද |
|---|---|---|---|
| 12 | **I** | **1.1, 1.2, 1.3, 2.1, 2.2, 3.1, 3.2, 3.3, 3.4** | **100** |
| | **II** | **4.1, 4.2, 5.1, 5.2, 6.1, 6.2** | **100** |
| | **III** | **7.1, 7.2, 8.1, 8.2, 8.3** | **100** |
| 13 | **I** | **9.1, 9.2, 10.1, 10.2, 11.1, 11.2, 11.3** | **100** |
| | **II** | **12.1, 12.2, 12.3, 13.1, 13.2** | **100** |
| | **III** | **14.1, 14.2, 14.3, 14.4, 14.5, 15.1, 15.2, 15.3, 15.4** | **100** |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 1. දේශපාලනය සහ දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනා ගත් පුරවැසියකු ලෙස ක්‍රියා කරයි. | 1.1 දේශපාලනය, සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙස අර්ථ-කථනය කරයි. | 1.1 දේශපාලන විද්‍යාව හඳුනා ගැනීම<br>• දේශපාලනය යනු කුමක් ද? | • දේශපාලනය හා දේශපාලන විද්‍යාව අර්ථකථනය කරයි. | 05 |
| | 1.2 දේශපාලන විද්‍යාව, දේශපාලනයේ විවිධ පැතිකඩ ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කරන ශික්ෂණ මාධ්‍යයක් ලෙස විග්‍රහ කරයි. | 1.2 දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය | • දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධතා හා වෙනස්කම් හඳුනාගෙන පැහැදිලි කරයි. | 10 |
| | 1.3 විෂයයට අනන්‍ය වූ විවිධ ප්‍රවේශ භාවිත කරමින් දේශපාලනය හදාරයි. | 1.3 දේශපාලන විද්‍යාව ශාස්ත්‍රීය ලෙස හැදෑරීම<br><br>1.4 දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ<br>• දාර්ශනික/ප්‍රතිමානීය ප්‍රවේශය<br>• තුලනාත්මක ප්‍රවේශය<br>• බහු විෂයික ප්‍රවේශය<br>• විද්‍යාත්මක (චර්යාවාදී) ප්‍රවේශය<br>• දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය<br>• සමාජ විද්‍යාත්මක ප්‍රවේශය<br>• ස්ත්‍රීවාදී ප්‍රවේශය | • දේශපාලනය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීමේ ප්‍රවේශ නම් කර ඒවා එකිනෙක විස්තර කරයි.<br>• එකී ප්‍රවේශ විචාරාත්මක ව විමසයි.<br>• දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීමෙන් තමා ද අයත් වන සමාජ ලෝකයේ දේශපාලන ක්‍රියාකාරිත්වයට සමාජීය ලෙස දායක විය හැකි ආකාර ගැන සිතයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 2. දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ ඇතුළත් වන තේමා හඳුනා ගනිමින් දේශපාලන විද්‍යාව අධ්‍යයනයට සූදානම් වෙයි. | 2.1 දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් වන තේමාවල ස්වභාවය සහ අන්තර්ගතය හදාරයි.<br><br>2.2 සමාජයේ දේශපාලන ජීවිතය තුළ එම තේමාවන් හි කාර්යභාරය විමර්ශනය කරයි. | 2 දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් වන තේමා.<br>2.1 දේශපාලන දර්ශනය<br>2.2 දේශපාලන චින්තනය සහ මතවාද<br>2.3 දේශපාලන න්‍යාය<br>2.4 දේශපාලන ආයතන<br>i රාජ්‍යය සහ ආණ්ඩුව<br>ii දේශපාලන පක්ෂ<br>iii බලපෑම් කණ්ඩායම්<br>iv සිවිල් සමාජය<br>2.5 තුලනාත්මක දේශපාලනය<br>2.6 රාජ්‍ය පරිපාලනය<br>2.7 ජාත්‍යන්තර සම්බන්ධතා හා ලෝක දේශපාලනය<br>2.8. ගැටුම් හා ගැටුම් සමථනය | ● දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ ඇතුළත් තේමා නම් කර විස්තර කරයි.<br>● ඒ එක් එක් තේමා දේශපාලන විද්‍යා අධ්‍යයන විෂය ක්ෂේත්‍රය පරිපූර්ණ (holistic) කරන ආකාරය පැහැදිලි කරයි.<br>● එම තේමා පිළිබඳ අවබෝධය දේශපාලන ලෝකය සම්බන්ධ ව විචාරාත්මක ව සිතීමට ආධාර කර ගනියි. | 10<br><br>10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 3. තමා ද පුරවැසියකු වන රාජ්‍යය පිළිබඳ ව න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයකට පදනම සකසා ගනියි. | 3.1 රාජ්‍යය යන සංකල්පය පැහැදිලි කරයි. | 3 රාජ්‍යය<br>3.1 රාජ්‍යය සහ එහි භූමිකාව<br>• සමාජයෙහි පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ප්‍රකාශනය ලෙස රාජ්‍යය<br>• නූතන භෞමික රාජ්‍යය<br>• නූතන ජාතික රාජ්‍යය<br>• ගෝලීයකරණය සහ රාජ්‍යය | • රාජ්‍යය අර්ථකථනය කර එහි කාර්යභාරය විස්තර කරයි.<br>• නූතන භෞමික රාජ්‍යයේ සහ ජාතික රාජ්‍යයේ ලක්ෂණ හඳුන්වයි.<br>• ගෝලීයකරණය, රාජ්‍යය කෙරෙහි ඇති බලපෑම විමර්ශනය කරයි. | 10 |
| | 3.2 රාජ්‍යය පිළිබඳ වර්ගීකරණය පදනම් කොට ගෙන රාජ්‍යය යන තේමාව විමර්ශනය කරයි. | 3.2 රාජ්‍ය මාදිලි හා වර්ගීකරණය<br>• ගෝත්‍රික<br>• ග්‍රීක පෞර රාජ්‍යය<br>• රාජාණ්ඩුව<br>• යටත්විජිතවාදී රාජ්‍යය<br>• ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී<br>• සමාජවාදී<br>• පැසිස්ට්වාදී<br>• පශ්චාත් යටත්විජිතවාදී<br>• නව ලිබරල්වාදී | • රාජ්‍ය මාදිලි වර්ග කර විග්‍රහ කරයි. | 25 |
| | 3.3 රාජ්‍යය පිළිබඳ දේශපාලන සංකල්ප ආශ්‍රයෙන් නූතන රාජ්‍යය මාදිලි විග්‍රහ කරයි. | 3.3 රාජ්‍යය පිළිබඳ දේශපාලන විද්‍යා සංකල්ප<br>• රාජ්‍යය සහ ස්වාධිපත්‍යය<br>• රාජ්‍යය හා පුරවැසි භාවය | • රාජ්‍යය, ස්වාධිපත්‍යය හා පුරවැසියා යන සංකල්ප අර්ථකථනය කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 3.4 රාජ්‍යය හා එහි ස්වභාවය දේශපාලන විද්‍යා සංකල්ප සහ න්‍යාය ආශ්‍රයෙන් විග්‍රහ කරයි. | • රාජ්‍යය, ආණ්ඩුව සහ පාලන තන්ත්‍රය අතර සම්බන්ධතා හා වෙනස්කම්<br><br>3.4 රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ න්‍යායික ප්‍රවේශ<br>• සමාජ සම්මුති වාදය<br>• මාක්ස්වාදය<br>• ලිබරල් වාදය<br>• ස්ත්‍රීවාදය | ● රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ න්‍යායික ප්‍රවේශ නම් කර ඒවා එකිනෙක විස්තර කරයි.<br>● මිනිස් නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයට වඩාත් යෝග්‍ය වන ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 4. ලෝකයේ පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති ප්‍රභේද ආශ්‍රයයෙන් ආණ්ඩු ක්‍රම විග්‍රහ කිරීමට ඇති හැකියාව ප්‍රකාශ කරයි. | 4.1 රාජ්‍යයේ බලය බෙදීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති සකස් වී ඇති ආකාරය විස්තර කරයි. | 4 ආණ්ඩුක්‍රම ආකෘති<br>4.1 රාජ්‍ය බලය බෙදීම පදනම් කොට ගෙන පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති<br>• ඒකීය<br>• සන්ධීය<br>• අර්ධ සන්ධීය<br>• සහසන්ධීය | • රාජ්‍යයේ බලය බෙදීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති හඳුනා ගනිමින් ඒවා අර්ථකථනය කරයි.<br>• එකී ආණ්ඩුක්‍රමවල ලක්ෂණ සහ වාසි, අවාසි පෙන්වා දෙයි.<br>• විධායක බලය සංවිධානය වීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති හඳුනා ගනිමින් අර්ථකථනය කරයි. | 15 |
| | 4.2 විධායක බලය සංවිධානය කිරීම අනුව ආණ්ඩුක්‍රම ආකෘති සකස් වී ඇති ආකාරය විස්තර කරයි. | 4.2 විධායක බලය සංවිධානය කිරීම අනුව පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති<br>• කැබිනට් ආණ්ඩු ක්‍රමය<br>• ජනාධිපති ආණ්ඩු ක්‍රමය<br>• මිශ්‍ර ආණ්ඩු ක්‍රමය<br>• ඒක තන්ත්‍ර ආණ්ඩු ක්‍රමය | • එකිනෙක ආණ්ඩුක්‍රමවල ඵලදායී භාවය පිළිබඳ ව තුලනාත්මක ව අදහස් දක්වයි.<br>• ලංකාවේ දැනට තිබෙන ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ, ඉගෙනගත් ආණ්ඩුක්‍රම මාදිලි ආශ්‍රයයෙන් විග්‍රහ කරයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 5. දේශපාලන මතවාදවල ස්වභාවය හඳුනා ගෙන නූතන දේශපාලන ක්‍රියාවලි සහ ආයතන පිළිබඳ ව නිර්ණය කිරීමට ඒ දේශපාලන මතවාද මගින් ඉටුකරනු ලැබ ඇති කාර්ය භාරය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 5.1 විවිධ දේශපාලන මතවාද හඳුනා ගනියි.<br><br>5.2 ඒවායේ මූලික ලක්ෂණ සහ දේශපාලන ක්ෂේත්‍රයෙහි ඒවායේ කාර්යභාරය විචාරාත්මක ව විමසයි. | 5 දේශපාලන මතවාද<br>• ලිබරල්වාදය<br>• සමාජවාදය<br>• සමූහාණ්ඩුවාදය<br>• සමාජ ප්‍රජාතන්ත්‍රවාදය<br>• ෆැසිස්ට්වාදය<br>• ජාතිකවාදය<br>• නිරාගමිකවාදය<br>• ස්ත්‍රීවාදය | • දේශපාලන මතවාද අර්ථකථනය කරයි.<br>• එකී දේශපාලන මතවාද තුලනාත්මක ව විග්‍රහ කරයි.<br>• මෙම දේශපාලන මතවාද දේශපාලනයට බලපා ඇති ආකාරය දේශපාලන සංසිද්ධි ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• වඩා යහපත් දේශපාලන අනාගතයක් ගැන සිතීමට මෙම දැනුම ඉවහල් කර ගනියි. | 15<br><br>15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 6. ගැටුම්වල ස්වභාවය අවබෝධ කොට ගෙන ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩ නැඟීම පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි. | 6.1 ගැටුම් සහ ගැටුම් සමථනය පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික අංශ පැහැදිලි කරයි.<br>6.2 සාමය ගොඩනැඟිමේ සහ ප්‍රතිසන්ධානගත වීමේ වැදගත්කම පිළිබඳ ව විචාරාත්මක ව අදහස් දක්වයි. | 6. ගැටුම් හා ගැටුම් සමථනය<br>6.1 ගැටුම් පිළිබඳ මූලික නිර්වචන හා වර්ගීකරණය<br><br>6.2 ගැටුම් සමථන ක්‍රියාවලිය<br>• කල් තබා අනතුරු ඇඟවීම<br>• ගැටුම් වැළැක්වීම<br>• ගැටුම් කළමනාකරණය<br>• ගැටුම් පරිවර්තනය<br>• පශ්චාත් ගැටුම් සාමය ගොඩනැඟීම<br><br>6.3 ගැටුම් සමථන මාධ්‍ය<br>• සහමන්ත්‍රණය<br>• මැදිහත්කරණය<br>• සාම ගිවිසුම්<br>• සාමය ගොඩනැඟීම<br>6.4 සාමය ගොඩනැඟීම<br>• නිර්වචන හා ප්‍රවේශ<br>• ප්‍රතිසන්ධානගත වීම | • ගැටුම් නිර්වචනය කර වර්ගීකරණය කරයි.<br>• ගැටුම් නිරාකරණය කළ හැකි ක්‍රම අර්ථ දක්වයි.<br>• ගැටුම් හඳුනා ගැනීමට කල් තබා අනතුරු ඇඟවීමේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.<br>• ගැටුම් වළක්වා ගැනීමට මැදිහත් වෙයි.<br>• ගැටුම් කළමනාකරණයට සමත් අයකු ලෙස ක්‍රියා කරයි.<br>• ගැටුම් පරිවර්තනය විචාරාත්මක ව විමර්ශනය කරයි.<br>• ගැටුම් සමථන මාධ්‍යය පැහැදිලි කරයි.<br>• " සාමය ගොඩනැඟීම" යන්න හඳුන්වයි.<br>• ගැටුම් සමථනය සහ සාමය ගොඩනැඟීම වර්තමාන ලෝකයට අදාළ වන ආකාරය පැහැදිලි කරයි.<br>• තම ජීවිතයේ අත්දකින ගැටුම් සාධනීය ප්‍රතිඵල ඇති කරන පරිදි පරිවර්තනය කිරීම සඳහා උත්සාහ කරයි. | 20<br><br>20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 7. ශ්‍රී ලංකාවේ යටත්විජිත යුගයේ සිදුවූ ආර්ථික, සමාජ සහ දේශපාලන පරිවර්තනය හඳුනා ගනියි. | 7.1 යටත්විජිත වාදය සහ යටත්විජිත පාලන ක්‍රමය ලංකාවේ ආර්ථික සමාජ සහ දේශපාලන පරිවර්තනයට තුඩු දුන් ආකාරය විග්‍රහ කරයි. | 7 යටත්විජිත පරිවර්තන සහ එහි ප්‍රතිඵල<br>7.1 ආර්ථික හා සමාජ පරිවර්තන<br>• යටත්විජිත ධනවාදයේ ආරම්භය සහ ව්‍යාප්තිය<br>• යටත්විජිත සමාජපරිවර්තනය සහ නව පන්ති පෙළ ගැස්ම | • යටත්විජිත පරිවර්තනයේ ආර්ථික සහ සමාජ ගමන් මගේ ප්‍රවණතා සහ ප්‍රතිඵල විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ නූතන රාජ්‍යයට පදනම වැටුණු ආකාරය පැහැදිලි කරයි. | 25 |
| | 7.2 ශ්‍රී ලංකාවේ යටත්විජිත පරිවර්තනයේ ප්‍රතිවිපාක අවබෝධ කර ගනිමින් අදහස් දක්වයි. | 7.2 දේශපාලන ප්‍රතිඵල<br>• නූතන රාජ්‍යයට පදනම වැටීම<br>• නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ සම්භවය (ඩොනමෝර් ආණ්ඩුක්‍රමය පිළිබඳ විශේෂ අවධානයක් සහිත ව) | • ශ්‍රී ලංකාවේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය සහ විකාශය සිදු වූ ආකාරය පෙන්වා දෙයි.<br>• ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ විශ්ලේෂණය කරයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 8. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 8.1 නිදහසින් පසු ව්‍යවස්ථා සම්පාදනයට පසුබිම් වු සාධක විස්තර කරයි.<br><br>8.2 ආණ්ඩුක්‍රමවල ලක්ෂණ වෙන් වෙන් ව පැහැදිලි කරයි.<br><br>8.3 එම ආණ්ඩුක්‍රමවල ප්‍රවණතා හා ගැටලු පෙන්වා දෙයි. | 8 වෙස්ට්මින්ස්ටර් ආකෘතිය සහ එහි වෙනස් වීම්<br>8.1 1947 - 1972 ව්‍යවස්ථා යටතේ සිදු වූ ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනය සහ ප්‍රවණතා<br><br>8.2 ව්‍යවස්ථාදායකයේ සංයුතිය සහ ස්වාධිපත්‍යය<br><br>8.3 විධායකයේ ස්වභාවය සහ බලතල<br><br>8.4 සුළු ජන අයිතිවාසිකම්<br><br>8.5 අධිකරණය සහ රාජ්‍ය සේවය<br><br>8.6 මූලික අයිතිවාසිකම් | • 1947 - 1972 ව්‍යවස්ථා යටතේ සිදු වූ ව්‍යවස්ථා වර්ධනය සහ ප්‍රවණතා විග්‍රහ කරයි.<br>• 1947 සහ 1972 දක්වා ව්‍යවස්ථා යටතේ පැවති ව්‍යවස්ථාදායකවල සංයුතිය සහ ස්වාධිපත්‍යය තුලනාත්මක ව පැහැදිලි කරයි.<br>• 1947 සහ 1972 ව්‍යවස්ථා යටතේ විධායකයේ ස්වභාවය සහ බලතල තුලනාත්මක ව විග්‍රහ කරයි.<br>• සුළු ජන අයිතිවාසිකම්වල ස්වභාවය සහ සීමා පෙන්වා දෙයි.<br>• අධිකරණයේ ස්වාධීනත්වය සහ සීමා පෙන්වා දෙයි.<br>• අධිකරණය සහ රාජ්‍ය සේවය යන ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම් පරීක්ෂා කරයි.<br>• වඩා යහපත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක තිබිය යුතු ගුණාංග කවරේ දැයි විමසා බලයි. | 10<br><br>10<br><br>30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 9. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ ඇති අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 9.1 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ න්‍යායික පදනම හඳුනා ගනියි. | 9. ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය<br>9.1 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ සංකල්පීය පදනම<br>i ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය<br>ii නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය | • ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ලක්ෂණ හඳුනාගෙන විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයේ පවත්නා හා නොපවත්නා ප්‍රජාතන්ත්‍රීය ලක්‍ෂණ විචාරාත්මක ව පෙන්වා දෙයි.<br>• ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ලංකාවට ගැළපෙන්නේ මන්දැයි පෙන්වා දෙයි. | 12 |
| | 9.2 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ප්‍රායෝගික පැතිකඩ විශ්ලේෂණාත්මක ව දකියි. | 9.2 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සහ එහි ලක්ෂණ<br>i ව්‍යවස්ථානුකූලවාදය<br>ii මහජන පරමාධිපත්‍යය<br>iii බලතල බෙදීම<br>iv සංවරණ සහ තුලන<br>v නීතියේ ආධිපත්‍යය<br>vi මානව අයිතිවාසිකම්<br>vii සීමිත ආණ්ඩුව<br>viii නිදහස් සහ සාධාරණ මැතිවරණ<br>ix ප්‍රජාවට වගවීම | | 28 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 10. සමකාලීන ලෝකයේ පවත්නා විවිධ ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ තුලනාත්මක අවබෝධයකින් යුතු පුද්ගලයකු ලෙස ක්‍රියා කරයි. | 10.1 සමකාලීන ලෝකයේ ඒකීය සහ සන්ධීය ආණ්ඩු ක්‍රමවල අනන්‍යතාව සහ වෙනස්කම් විග්‍රහ කරයි.<br><br>10.2 විවිධ ආණ්ඩුක්‍රම ආකෘතිවල න්‍යායාත්මක පදනම සහ ප්‍රායෝගික ලක්ෂණ තුලනාත්මක ව අධ්‍යයනය කරයි. | 10. සමකාලීන ආණ්ඩුක්‍රම මාදිලි<br><br>10.1 සන්ධීය මාදිලි<br>i ඇමරිකානු ක්‍රමය<br>ii ඉන්දියානු ක්‍රමය<br>iiiස්විට්සර්ලන්ත ක්‍රමය<br><br>10.2 ඒකීය රාජ්‍යවල පරිවර්තන<br>i බ්‍රිතාන්‍ය<br>ii ශ්‍රී ලංකාව<br><br>10.3 ඒකීය සහ මධ්‍යගත රාජ්‍ය ව්‍යූහය<br>i ප්‍රංශය | • සමකාලීන ලෝකයේ පවතින සන්ධීය ආණ්ඩුක්‍රම මාදිලි නම් කර විග්‍රහ කරයි.<br>• ඒකීය රාජ්‍යවල පරිවර්තන බ්‍රිතාන්‍යය සහ ශ්‍රී ලංකාව ඇසුරින් පෙන්වා දෙයි.<br>• ඒකීය සහ මධ්‍යගත ආණ්ඩුක්‍රම මාදිලි උදාහරණ සහිත ව විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවට වඩාත් උචිත ආණ්ඩුක්‍රම මාදිලියක මූලිකාංග යෝජනා කිරීමේ කුසලතා අත්පත් කර ගනියි. | 20<br><br>20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 11. රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම දේශපාලන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ය යන අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 11.1 දේශපාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ කරන ක්‍රියාවලිය විස්තර කරයි. | 11 රාජ්‍ය ප්‍රතිපත්ති සහ දේශපාලන ක්‍රියාවලි<br><br>11.1 රාජ්‍ය ප්‍රතිපත්ති නිර්වචනය කිරීමේ සහ ඒවා හැදෑරීමේ වැදගත්කම | • රාජ්‍ය ප්‍රතිපත්ති යන්න නිර්වචනය කරයි.<br>• රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• රාජ්‍ය ප්‍රතිපත්ති සහ දේශපාලන ක්‍රියාවලිය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරයි. | 10 |
| | 11.2 රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ ව දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජයේ කාර්ය භාරය විමර්ශනය කරයි. | 11.2 රාජ්‍ය ප්‍රතිපත්ති සහ දේශපාලන අධිකාරිය | • රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ ව සිවිල් සමාජයේ සහ දේශපාලන පක්ෂවල කාර්යභාරය විස්තර කරයි. | 05 |
| | 11.3 රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියෙහි ලා නිල බල ක්‍රමයේ භූමිකාව පැහැදිලි කරයි. | 11.3 රාජ්‍ය ප්‍රතිපත්ති සහ දේශපාලන පක්ෂ<br><br>11.4 රාජ්‍ය ප්‍රතිපත්ති සහ සිවිල් සමාජය<br><br>11.5 රාජ්‍ය ප්‍රතිපත්ති සහ නිල බල ක්‍රමය | • රාජ්‍ය ප්‍රතිපත්ති සහ නිල බල ක්‍රමය අතර සම්බන්ධතාව පෙන්වා දෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 12. 1978 ව්‍යවස්ථාව යටතේ ඇති වූ ආණ්ඩුක්‍රමයේ ව්‍යූහාත්මක ලක්ෂණ, ආයතනික සංයුතිය සහ බලතුලනය හඳුනාගෙන පැහැදිලි කරයි. | 12.1 1978 ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යූහය, බල කේන්ද්‍රණය සහ ආයතනික සංයුතිය පිළිබඳ ව අධ්‍යයනය කරයි. | 12.1 මෙම ව්‍යවස්ථාවේ මූලික ව්‍යූහාත්මක සහ ආයතනික ලක්ෂණ<br>i විධායකය<br>ii ව්‍යවස්ථාදායකය<br>iii ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර සම්බන්ධතාව<br>iv අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ න්‍යාය සහ භාවිතය<br>v විධායකය සහ රාජ්‍ය සේවය<br>vi විධායකය සහ බල කේන්ද්‍රණය<br>vii මූලික අයිතිවාසිකම් හා අධිකරණය, ඔම්බුඩ්ස්මන්<br>viii මැතිවරණ ක්‍රම<br>ix ජනමත විචාරණය | • 1978 ව්‍යවස්ථාව යටතේ විධායකයේ ස්වභාවය, බලතල සහ කාර්යයන් විග්‍රහ කරයි.<br>• ව්‍යවස්ථාදායකයේ ස්වභාවය, බලතල සහ කාර්යයන් විග්‍රහ කරයි.<br>• ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර සම්බන්ධය පැහැදිලි කරයි.<br>• අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ න්‍යාය සහ භාවිතය විමසා බලයි.<br>• විධායකය සහ රාජ්‍ය සේවය අතර සම්බන්ධතාව හා එය රාජ්‍ය සේවයට බලපෑ ආකාරය පිළිබඳ අදහස් පළ කරයි.<br>• විධායකය වෙත බලය කේන්ද්‍රගත වී ඇති ආකාරය හා එහි ප්‍රතිඵල පැහැදිලි කරයි.<br>• ඔම්බුඩ්ස්මන්වරයා, මූලික අයිතිවාසිකම් සහ අධිකරණය, පිළිබඳ ව්‍යවස්ථා විධිවිධාන විස්තර කරයි.<br>• විවිධ මැතිවරණ ක්‍රම සහ මහජන ප්‍රතිචාර තුලනාත්මක ව විස්තර කරයි. | 50 |
| | 12.2 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යූහාත්මක ස්වභාවය වෙනස් කළ සංශෝධනවල පසුබිම හඳුනා ගනියි. | 12.2 13, 17, 18 සහ 19 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවල පසුබිම සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යූහයට ඒවායේ බලපෑම | | 10 |
| | 12.3 1978 සංශෝධනවලින් ආණ්ඩුක්‍රමයට ඇති කළ වෙනස්කම්-වල ස්වභාවය හඳුනාගනියි. (13, 17, 18 සහ 19 වන සංශෝධන) | | • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මඟින් සිදු වූ වෙනස්කම් හා ප්‍රතිඵල පැහැදිලි කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 13. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වභාවය සහ ප්‍රවණතා ඒවායේ ක්‍රියාකාරිත්වය ඔස්සේ ගෙනහැර දක්වයි. | 13.1 ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.<br><br>13.2 දේශපාලන පක්ෂ ක්‍රමයේ ලක්ෂණ සහ ප්‍රවණතා විග්‍රහ කරයි. | 13 ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය<br><br>13.1 පක්ෂ ක්‍රමයේ ආරම්භය සහ ප්‍රවණතා<br>i අධිපති ද්වි පක්ෂ ක්‍රමය<br>ii වාමාංශික හා කුඩා පක්ෂ<br>iii වාර්ගික අනන්‍යතා පදනම් වූ පක්ෂ<br>iv දේශපාලන පක්ෂ සහ සභාග<br>v පක්ෂ ක්‍රමය සහ දේශපාලන නායකත්වය | • දේශපාලන පක්ෂ ක්‍රමයේ ආරම්භය හා විකාශනය පැහැදිලි කරයි.<br>• පක්ෂ ක්‍රමයේ ලක්ෂණ සහ එහි ප්‍රවණතා ගෙන හැර දක්වයි.<br>• අධිපති ද්වි පක්ෂ ක්‍රමය හඳුනාගෙන ඒ පිළිබඳ අදහස් දක්වයි.<br>• වාමාංශික හා කුඩා පක්ෂ පිළිබඳ තොරතුරු විමසයි.<br>• වාර්ගික අනන්‍යතා මත පදනම් වූ පක්ෂ හඳුනාගෙන ඒවා විග්‍රහ කරයි.<br>• සභාග ආණ්ඩු බිහි වීමට දේශපාලන පක්ෂ ක්‍රමය තුඩු දුන් අයුරු විමසා බලයි.<br>• පක්ෂ ක්‍රමය සහ දේශපාලන නායකත්වය අතර සම්බන්ධතාවේ ස්වභාවය විග්‍රහ කරයි.<br>• ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ශක්තිය සහ දුබලතා හඳුනාගෙන වඩා හොඳ පක්ෂ ක්‍රමයක් යෝජනා කිරීමේ හැකියාව ලබා ගනියි. | 10<br><br>20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 14. ජාත්‍යන්තර දේශපාලනයේ ස්වභාවය හා ප්‍රවණතා හඳුනාගෙන අදහස් දක්වයි. | 14.1 ජාතික හා ජාත්‍යන්තර දේශපාලනයේ වෙනස්කම් හඳුනා ගනියි.<br>14.2 ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාධරයන් හඳුනා ගනිමින් අදහස් දක්වයි. | 14 ජාත්‍යන්තර දේශපාලනය<br>14.1 ජාතික සහ ජාත්‍යන්තර දේශපාලන වෙනස්කම්<br>14.2 ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාධරයෝ<br>i ජාතික රාජ්‍ය<br>ii අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන<br>iii අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන<br>iv බහු ජාතික සමාගම්<br>v කීර්තිමත් පුද්ගලයෝ<br>vi ත්‍රස්තවාදී කණ්ඩායම් සහ සංවිධාන | • ජාතික සහ ජාත්‍යන්තර දේශපාලනය අතර ඇති වෙනස්කම් හඳුනාගෙන ඒවා විග්‍රහ කරයි.<br>• ජාත්‍යන්තර දේශපාලනයේ දී වැදගත් වන ආයතන සහ ක්‍රියාධරයන් හඳුනා ගනියි. | 04<br>25 |
| | 14.3 ජාතික බලයේ සහ ජාතික අභිලාෂ-වල ස්වරූපය පැහැදිලි කරයි. | 14.3 ජාතික බලය සහ ජාතික අභිලාෂ | • ජාතික බලය සහ ජාතික අභිලාෂ යන සංකල්ප අර්ථ දක්වයි. | 06 |
| | 14.4 ජාත්‍යන්තර දේශපාලනයේ වර්තමාන ප්‍රවණතා හඳුනා ගෙන ඒවා පැහැදිලි කරයි. | 14.4 සමකාලීන ලෝක දේශපාලනයේ ප්‍රධාන ප්‍රවණතා<br>i බහු ධ්‍රැවීය ලෝක ක්‍රමය<br>ii විකල්ප ජාත්‍යන්තර සම්බන්ධතා ජාල | • වර්තමාන ලෝක දේශපාලනයේ නව ප්‍රවණතා විග්‍රහ කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 14..5 ජාතික හා ජාත්‍යන්තර දේශපාලනයේ නව ප්‍රවණතා ලංකාවට අදාළ ව හඳුනා ගෙන විග්‍රහ කරයි. | iii නව සමාජ ව්‍යාපාර<br>iv ලෝක ක්‍රමයට එරෙහි කැරලිකාර ව්‍යාපාර<br><br>14.5 නව ලෝක දේශපාලන ප්‍රවණතා ශ්‍රී ලංකාවට බලපාන ආකාරය | • නව ලෝක දේශපාලන ප්‍රවණතා ලංකාවට බලපාන ආකාරය පැහැදිලි කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 15. බාහිර ලෝකය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතාවල ස්වභාවය සහ ඵල විපාක පිළිබඳ අවබෝධයෙන් අදහස් දක්වයි. | 15.1 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ක්‍රියාකාරිත්වයට බලපාන සාධක විග්‍රහ කරයි.<br><br>15.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ලක්ෂණ සහ ප්‍රවණතා පැහැදිලි කරයි.<br><br>15.3 ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවණතා විශ්ලේෂණය කරයි.<br><br>15.4 වර්තමාන විදේශ ප්‍රතිපත්තියේ අභියෝග සහ ගැටලු අවබෝධ කර ගනිමින් අදහස් ප්‍රකාශ කරයි | 15 ශ්‍රී ලංකාව හා ලෝකය<br>15.1 ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය<br>15.2 ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක<br>15.3 ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ විශේෂ ලක්ෂණ<br>15.4 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවණතා<br>• එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ශ්‍රී ලංකාව<br>• පොදු රාජ්‍ය මණ්ඩලය සහ ශ්‍රී ලංකාව<br>• නොබැඳි ව්‍යාපාරය හා ශ්‍රී ලංකාව<br>• දකුණු ආසියානු සහයෝගිතාව සහ ශ්‍රී ලංකාව<br>• ජාත්‍යන්තර ආර්ථික, මූල්‍ය ආයතන සහ ශ්‍රී ලංකාව<br>• ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ ශ්‍රී ලංකාව<br>15.5 වර්තමාන විදේශ ප්‍රතිපත්තිය අභියෝග සහ ගැටලු | • ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක විග්‍රහ කරයි.<br>• එහි ලක්ෂණ සහ නව ප්‍රවණතා විමර්ශනය කරයි.<br>• ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවණතා කවරේ දැයි හඳුන්වයි.<br>• ශ්‍රී ලංකාව අන්තර්ජාතික සංවිධානවල සාමාජිකයකු ලෙස ලබන ප්‍රතිලාභ සහ බලපෑම් පැහැදිලි කරයි.<br>• ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා ශ්‍රී ලංකාව අතර ඇති සම්බන්ධතා සහ අභියෝග විස්තර කරයි.<br>• ජාත්‍යන්තර දේශපාලනයේ නව ප්‍රවණතා ලංකාවට අදාළ වන ආකාරය විමර්ශනය කරයි. | 05<br><br>10<br><br>30 |

**පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්**

අධ්‍යාපනයේ ජාතික අරමුණු ඉටු කරගත හැකි පරිදි සැලැසුම් කරන ලද විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු වඩා සාර්ථක ඉගෙනුම් අත්දැකීම් බවට පරිවර්තනය කිරීම සඳහා විෂය හදාරන සෑම ශිෂ්‍යයකුට ම සහභාගි විය හැකි ඉගෙනුම් ක්‍රියාකාරකම් සහිත වැඩ සටහන් සම්පාදනය කිරීම පාසල් පාලන අධිකාරීන්ගේ වගකීමක් වෙයි. පහත සඳහන් වන්නේ එවැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයකි.

- දේශපාලන විද්‍යා සංගමයක් පිහිටුවීම හා එමඟින් දැනුම මිනුම වැඩසටහන්, විවාද, ප්‍රදර්ශන, බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන වැනි නිර්මාණශීලී ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කිරීම.
- විෂය අන්තර්ගතය යටතේ අධ්‍යයනය කරනු ලබන ආයතන සහ ඒවායේ කාර්යභාරය පිළිබඳ ව අවබෝධය ලබාගැනීම සඳහා අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම.
- දේශපාලන මතවාද, දේශපාලන චින්තන විචාරශීලී ව හැදෑරීම සඳහා කුඩා පරිමාණයේ පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම.
- ප්‍රදේශයේ ඇති විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සමඟ අත්දැකීම් හුවමාරු කරගැනීමට යොමු කිරීම.
- ජාත්‍යන්තර සඟරා සහ අන්තර්ජාලය භාවිතය ඇසුරෙන් දැනුම වර්ධනය කරගැනීමට යොමු කිරීම.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

දේශපාලන විද්‍යා විෂයයට අදාළ ව පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රමෝපාය අනුගමනය කළ හැකි ය.

- බුද්ධි කලම්බන සාකච්ඡා.
- සඟරා නිර්මාණය කිරීම.
- ප්‍රශ්නෝත්තර සංග්‍රහ සකස් කිරීම.
- විවාද පැවැත්වීම.
- අත් පත්‍රිකා සකස් කිරීම.
- විවෘත ග්‍රන්ථ පරිශීලනය.
- සංවාද මණ්ඩප.
- භූමිකා රංගන.
- ප්‍රායෝගික ක්‍රියාකාරකම් - උදාහරණ: මැතිවරණයක් පැවැත්වීමට සැලසුම් කිරීම්.
- ඉදිරිපත් කිරීම. (Presentation)

**තක්සේරුකරණය හා ඇගයීම්.**

- පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතාවලට හා නිපුණතා මට්ටම්වලට අදාළ වන පරිදි මඟපෙන්වීමක් ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිහිපයක් ඉදිරිපත් කර ඇත. ගුරු භවතුන් හට මෙම සැලසුම් යොදාගනිමින් මෙන් ම ස්වනිර්මාණ සැලසුම් සකස් කරගනිමින් පාඩම් සංවර්ධනය කරගත හැකි ය.

- මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2019 වර්ෂයේ දී පැවැත්වේ.

- මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ විස්තර විභාග දෙපාර්තමේන්තුව මඟින් සැපයෙනු ඇත.

## විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

**අභ්‍යන්තර**

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. ඒ. කුමුදේන්ද්‍රි සුදර්ශනී මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම. |
| එස්. කරුණාකරන් මයා | කථිකාචාර්ය | සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම. |

**බාහිර**

| | | |
|---|---|---|
| මහාචාර්ය ජයදේව උයන්ගොඩ මයා | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ. |
| ආචාර්ය අතුල විතානවසම් මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය. |
| ආචාර්ය උපුල් අබේරත්න මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | රුහුණු විශ්ව විද්‍යාලය, මාතර |
| ටෙරන්ස් පුරසිංහ මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ. |
| එම්. රංජිත් මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | සබරගමුව විශ්ව විද්‍යාලය, බෙලිහුල්ඔය. |
| ආචාර්ය ඒ. භාෂ්කරන් මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය |
| කල්‍යාණි චිත්‍රා ද සිල්වා මිය | ගුරු සේවය | සුජාතා බාලිකා විද්‍යාලය, නුගේගොඩ. (විශ්‍රාමික, වේල්ස් කුමරි විදුහල, මොරටුව) |
| ඩබ්ලිව්.කේ.සී. ප්‍රියන්ති මිය | ගුරු සේවය | විහාරමහා දේවි බාලිකා විද්‍යාලය, කිරිබත්ගොඩ. |
| එම්. සෞන්දරාජන් මයා | ගුරු සේවය | අල්අදාන් මුස්ලිම් විද්‍යාලය, බදුල්ල |